අධ්‍යාපන සමූපකාර සමිතිය
கல்வி கூட்டுறவு சங்கம்
Education Co-operative Society

# නුවරඑළිය නිවාඩු නිකේතනය සඳහා ආහාර සැපයීමේ සේවාව වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.

සමිතිය සතු නුවරඑළිය බේකර්ස් ෆාම්, මහගස්තොට පිහිටි 50 දෙනෙකුට පමණ නේවාසික වීමේ පහසුකම් සහිත නිවාඩු නිකේතනය සඳහා උදේ, දිවා සහ රාත්‍රී ආහාර සැපයීම හා පිසීමේ සේවාවන් සැපයීමට හැකි පළපුරුදු ආයතනයක් තෝරා ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

සේවා පිරිවිතර **(Terms of Reference / Specifications)**

**2.** සේවාවේ ස්වභාවය

තෝරා ගන්නා ආයතනය විසින් පහත සේවාවන් සැපයිය යුතුය.

**2.1** ආහාර සැපයීම/පිසීම

- දිනපතා
    - උදේ ආහාර
    - දිවා ආහාර
    - රාත්‍රී ආහාර

**2.2** නේවාසික ධාරිතාව

- දිනකට ආසන්න වශයෙන් පුද්ගලයින් 50 දෙනෙකු සඳහා ආහාර සැපයිය යුතුය.
- නේවාසික සංඛ්‍යාව දෛනිකව වැඩි හෝ අඩු විය හැක.

**2.3** මුළුතැන්ගෙයි පහසුකම්

- මුළුතැන්ගෙය හා මූලික ආහාර පිසීමේ උපකරණ EDCS ආයතනය විසින් ලබා දෙනු ඇත.
- එම උපකරණ නිසි පරිදි භාවිතා කිරීම හා නඩත්තු කිරීම සේවා සපයන්නාගේ වගකීම වේ.

**2.4** ආහාර ප්‍රමිතිය

- සෞඛ්‍යාරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර ලබා දිය යුතුය.
- ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය නීති හා ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය.
- පිරිසිදුකම, ආහාර ගුණාත්මකභාවය සහ නිසි වේලාවට සේවාව සැපයීම අනිවාර්ය වේ.

**2.5** මෙනු සැලසුම්

- සතියකට හෝ මාසිකව මෙනු සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.
- අවශ්‍ය අවස්ථාවල විශේෂ ආහාර (Vegetarian / Diabetic / Medical diets) සැපයීමට හැකියාව තිබිය යුතුය.

### 3. පැවතිය යුතු සුදුසුකම්

අයදුම් කරන ආයතනය පහත සුදුසුකම් සපුරාලිය යුතුය.

- ආහාර සැපයීමේ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.
- BR / Company Registration / VAT (අදාළ නම්) පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- පෙර සේවා ලබාදුන් ආයතනවල නිර්දේශ ලිපි (Reference Letters) ඉදිරිපත් කිරීම වඩාත් සුදුසුය.
- ප්‍රමාණවත් සේවක සංඛ්‍යාව හා සෞඛ්‍ය සම්පන්නව පිරිසිඳු ලෙස ආහාර සකස් කළ හැකි කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය.

### 4. මිල ගණන් ඉදිරිපත් කිරීම

අයදුම්කරු විසින් පහත සඳහන් තොරතුරු ඇතුළත්ව මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

- එක් පුද්ගලයෙකු සඳහා
  - උදේ ආහාරය
  - දිවා ආහාරය
  - රාත්‍රී ආහාරය

  සඳහා වෙන වෙනම මිල සඳහන් කළ යුතුය.
- මාසික සම්පූර්ණ පැකේජ මිලක් (Optional) සඳහන් කිරීමටද පුළුවන

### 5. කොන්ත්‍රාත් කාලය

- මුල් කොන්ත්‍රාත් කාලය මාස 12ක් වන අතර කාර්ය සාධනය අනුව ගිවිසුම දීර්ඝ කළ හැක.

### 6. තෝරාගැනීමේ පදනම්

තේරීම පහත කරුණු මත සිදු කරනු ලැබේ.

- මිල ගණන්
- ආහාර ගුණාත්මකභාවය හා මෙනු සැලැස්ම
- පළපුරුද්ද
- සේවා හැකියාව
- පෙර සේවා වාර්තා දත්ත හා තොරතුරු
- සෞඛ්‍ය හා පිරිසිදුකම

### 7. අයදුම්පත් භාරදීම

සමිතිය විසින් ඉල්ලා ඇති තොරතුරු සහ ලේඛණ ඇතුලත්ව පහත ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ "නුවරඑළිය නිවාඩු නිකේතනය සඳහා ආහාර සැපයීම" යනුවෙන් සඳහන් කර 2026-06- දින ප.ව. 2.00 ට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය.

අතින් ගෙන එන මිළ ගණන් 03 මහල අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ තබා ඇති මිළ ගණන් බහාලුම් පෙට්ටියට බහාලිය යුතුය.

ප්‍රධාන සභාපති

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය

නො. 294, ගාලුපාර,

කොළඹ 03.

දුරකථන : 011-22 66 000 - EX 2010 / නුවරඑළිය නිවාඩු නිකේතනය : 052-22 34 512
විද්‍යුත් තැපැල : edcs.sch.recovery@gmail.com

# නුවරඑළිය නිවාඩු නිකේතනය සඳහා ආහාර සැපයීමේ අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ මූලික විස්තර

   අයදුම්කරුගේ නම / ආයතනයේ නම: ..............................................................................

   ලියාපදිංචි ලිපිනය : ..............................................................................

   දුරකථන අංක : ..............................................................................

   විද්‍යුත් තැපැල් ලිපිනය : ..............................................................................

   ව්‍යාපාර ලියාපදිංචි අංකය : ..............................................................................

   VAT / TIN අංකය (අදාළ නම්) : ..............................................................................

2. අත්දැකීම් හා සුදුසුකම්

   1. ආහාර සැපයීමේ ක්ෂේත්‍රයේ අත්දැකීම් කාලය : .............................
   2. මීට පෙර සේවා සැපයූ ආයතන / ස්ථාන : .............................

   | අංකය | ආයතනය / ස්ථානය | සේවා කාලය | පුද්ගලයින් ගණන |
   |---|---|---|---|
   | 1 | | | |
   | 2 | | | |
   | 3 | | | |

   3. ආහාර පිසීම සඳහා යොදා ගන්නා කාර්ය මණ්ඩල සංඛ්‍යාව : .............................
   4. සෞඛ්‍ය සහතික සහිත සේවකයින් සිටී ද? : ඔව් / නැත
   5. ආහාර සුරක්ෂිතතා ක්‍රමවේද අනුගමනය කරන්නේ ද? : ඔව් / නැත
   6. ආහාර සැපයීමේ හැකියාව

      දිනකට සැපයිය හැකි උපරිම පුද්ගලයින් සංඛ්‍යාව : .............................

      උදෑසන ආහාර සැපයීම : ඔව් / නැත

      දිවා ආහාර සැපයීම : ඔව් / නැත

      රාත්‍රී ආහාර සැපයීම : ඔව් / නැත

      විශේෂ ආහාර අවශ්‍යතා (Vegetarian / Diabetic / Kidney Diet ආදිය) සැපයිය හැකි ද? : ..............................................................................

7. මිල ගණන්

   ආහාර වේල එක් පුද්ගලයෙකු සඳහා මිල (රු.)

ආහාර මිල ඇතුළත් වට්ටෝරු (Menu) වෙනම අමුණා එවිය හැකිය.

උදෑසන ආහාර
දිවා ආහාර
රාත්‍රී ආහාර
තේ / කෙටි ආහාර

සටහන: සියලු මිල ගණන් බදු සහ අනෙකුත් ගාස්තු සමඟ සඳහන් කළ යුතුය.

8. අමතර තොරතුරු

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

9. ප්‍රකාශය

මා / අප විසින් ඉහත සඳහන් කළ සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි / කරමු. ආයතනය විසින් නියම කරනු ලබන කොන්දේසි හා නියමයන්ට අනුව සේවාව සැපයීමට එකඟ වෙමි / වෙමු.

අයදුම්කරුගේ අත්සන : ..................................................
නම : ..................................................
තනතුර : ..................................................
දිනය : ..................................................